# 17

පසුවදා නිමල්ට තවත් ලියුමක් ලැබිණි. මේ ලියුමේ කවරයේ ලිපිනය නාම ගම්නම වාර, කොම්මරය ආදිය එක්ක සහිත විය.

සුසාන තවමත් නැවත නිමල්ට ඉස්සෝප්පුවේ සිට නිවාකාලයේ තොරව ලියුම ලියන්නට නැකිවිය. පිටකවරයේ තිබුණේ කාන්තාගේ අත් අකුරු බව නම් පැහැදිලි විය. එහෙත් නිමල්ගේ හෝ සුසානගේ නම තිබ් නොතිබීම නිමල්ගේ කුතුහලයට කාරණ විය. එක්කෝ කාන්තා කලබලයෙන් ලියා තැපැල් කළ ලියුමක්. ඒ නැත්නම් - උවමනාවෙන්ම අමුතු කිරීමකින් ලියූ ලිපිනයක්.

නිමල් ලියුම හැර බැලුවේය.
එහි මෙසේ ලියා තිබිණි

"සුදූ!
මෙතරං සුදූ - ඔයාට ගොඩක් අමාරුද?
මට දැනුම් එන්නට බෑ, කතරගම ගිහින් බාරෙ
ඔප්පු කරල එන්නං. පුතත් බලාගෙන ඉන්නම්.
දන්නවනෙ, දැන් මං ගඟ සිරි ගොවලේ වැඩ -
ඇවිත් ආයෙට.. උදය සිරි කොහේද කියලා"

එමරක්යි. මේක මාර පට්ටිලක්! එතකොට මේ ලියුම ලියා තියෙන්නෙ උදයසිරි කියන කෙනෙක් — තම නිරිඳ හා පුතාට. එහෙමනම් උදයසේනගේ අත් අකුරු කවරයේ තිබෙන්නේ කොහොමද? ඇතුළත අකුරු නම් වෙනස්.

මේක මොන ඇත්තේ කොහොමද? 'ගඟ සිරි ගොවලයේ උදයසිරි කෙනෙක් වැඩ කරනවා ඇති. එතකොට ඇතුළත ලියුම ලියන්නට ඇත්තේ ඒ උදයසිරි. එහෙනම් උදයසේනගේ අත් අකුරින් ලියූ කවරයට ඒ ලියුම වැටුණේ කොහොමද? මෙය කවුරුන් හෝ උවමනාවෙන් කළ දෙයක්ද? මෙතැනත් විහිළුවක් නැතුවා.

අර පායනයේ වෙලාව මේ ලිපියේ ඇති එකම සම්බන්ධය දෙකම කඳුකර නිසයි. දකුණු කඳුකර සීල් එක මුද්‍රාවේ වැදී තිබිණි. එහෙත් මෙතැන යම්කිසි ගොඩුවක් තිබිණි. දකුණු කඳුකර ගඟ සිරි ගොවලයක් ඇත්නම් එතැන උදයසිරි

කොහොමත් ඉන්නා නම් අපූරු තරමින් ඒ 'උදයසිරිය' වෙත මේ කාමරයේ පාට බබළය ගින, ජමලිටිල්ල ගින යම් තේරුම් කර දීමක් තිබේවි.

නිමල් හෙළූ සුසුමේ යම් තරමක සහනයක් විය. එය නිරර්ථකාත්මක සුසුමකි. නමුත් කළුතර ගඟසිරි හෝටලයට යන විට නිරපේක්ෂව ගත් සුසුමක් විය එය.

පසුවදා වන විට වැසි අන්කා වෙරළ ඇවිත් තිබිණි. ඈ අම්මාව බලා ගන්නා හෙයින් නිමල්ට හිතේ තරමක සැනසිල්ලකින් මේ ගමන යා හැකිවිය.

මධ්‍යහ්නය වන විට ඔහු දකුණු කළුතරට ළඟා වූයේය. ගඟසිරි හෝටලය සොයා ගැනීම එතරම් අපහසුවක් නොවිය. ඒ ආගාර ඔලුව ලබින් තරමක ශෝභාගත් හෝටලය තුළ අසුන් ගෙන සිටියා.

නිමල්ද පිටුපස මුල්ලක අසුන් ගෙන 'බත් එකක්' ඕඩර් කළේය. ඔහුගේ ඇණවුම ගන්නට ආවේ සෝමෙය. සෝමෙ කෑම පිගාන මේසය මත තබන අතරේ නිමල් නිකමට,

"ඔයාගෙ නම මොකද්ද ?" කියා ඇසුවේය.

"මම සෝමෙ- ඇයි සර් ?"

මොහොතකට සෝමෙ, අර ලිපිය මතක් වීමෙන්දෝ මදක් කැළඹුණේය.

"නෑ නෑ - නිකමට ඇහුවෙ - මේ හෝටලේ ඔයාට අයිති එකක්ද ?"

"අනේ නෑ - සර්- අපේ මුදලාලිගෙ !"

"කවුද මුදලාලි ?"

"අපි කියන්නෙ ගන්දර මුදලාලි කියලා."

"හරි- හරි- ගන්දර මාතර."

"මං දන්නෙ නෑ සර්- මොකද්ද උවමනාව ?"

"නෑ මට ආරංචියක් ආවා, මේ බිස්නස් එකක් විකුණන්න තියෙනවා කියලා" නිමල් කටට ආවක් කීවේය.

"බිස්නස්- එකක්- විකුණන්න ?"

"ඔව් ඔව්. මේ හෝටලය විකුණන්න තියෙන එකක්ද ?"

"මොන විස්සුද සර් ? මේක හොඳට හොයන්න පුළුවන් බිස්නස් එකක් නෙ- අපේ මුදලාලි--"

"මුදලාලිට මුදල් හුඟක්ද පුළුවන්ද ?" නිමල් ඉවක් නොතබා

ඇසුවේය.

"මුදලාලි නුවරට තමයි එන්නෙ. ඇවිත් යනවා."

"මුදලාලි කොහේද ඉන්නෙ?"

"මං ඇඩ්‍රස් එකක් දන්නෙ නෑ සර්."

මේ මිනිහා දන්න මගුලක් නෑ යි විමල්ට සිතුණේය.

"සර්ට බත් එකක් ගේන්නද?"

"ඔව්."

"මාළු?"

"ඔව් - ගේන්න."

සෝමෙ ~~[illegible]~~ මුළුතැන් ගෙය අතට ගියේය.

විමල් තමා අවට බැලුවේය. මෙය විශාල හෝටලයක් නොවේ. ඇතුළත යම් කිසි අඳුරක් වෙයි. හැම දෙනාම කෑම ගන්නේ නිහඬවය. යම්කිසි ගුප්ත බවක් විමල්ට දැනෙන්නට විය. එය තමා හිතෙන් මවා ගත් දෙයක්ද?

තව මඳකින් කෙසඟ සිරුරින් යුත් තරුණයෙක් මුළුතැන් ගෙයින් ආවේ විමල්ගේ බත් පිඟාන රැගෙනය. අනතුරුව ඔහු යළිත් ගියේ අත සෝදන දීසියක් ගෙන ඒමටය. විමල් බලා සිටියේය.

එන එන මිනිසාගේ නම අහන්නට යුතුද? කවුන්ටරයේ ඉන්න තට්ටයා බුම්මාගත් ගමන් රෙජිස්ටරයකට හිස ඔබා ගෙන සිටියි. තවත් ආවතේව කරුවන් දෙදෙනෙක් එහා මෙහා යති.

මඳ වේලාවකට පසු විමල්ගේ අත සෝදන දිය රැගෙන සේවකයා මේසය වෙතට ආවේය.

"ඕයි - මේ!" ඔහු යන්නට හැරෙද්දී විමල් කතා කළේය.

"මොකද්ද තමුසෙගෙ නම?"

"නම සර්?"

"ඔව්."

"මං උදයසිරි - සර්."

විමල්ගේ වාක්‍යය එක්වරක් ඔහු ගා ගැස්සිණි. පරියට නැවතී යන්නට ඇතිතාක් මෙනි

"ඇයි සර්?"

"නෑ නිකං දැනගන්න තමයි. ඔයා මේ ගමේද?"

"නෑ සර්. මං මං වද්දුවෙ."

"මොකෝ හොඳයිද?"

"වරදක් නෑ සර්. ඔහේ ඉන්නවා සර්."

"අයියෝ උදය සිරි. මේ තේ එක අරන් යනවා"
කීවේ එවිට සිට ශී ඉවීන් උදයසිරි නිමල් වෙතින් ඉවතට
ගියේය.

උදය සිරි යන නම ඇසෙන්ට යළිත් නිමල්ගේ හැඟීම
ඔහු හා හැස්සුණි. මේ මිනිහා තමාගේ පියාට සම්බන්ධ වෙන්නේ
කොන අයුරකින්ද?

තමා උදයසිරි හා සම්බන්ධවන්නේ කොහොමද?
එය සැකයක් ඇති නොවන ආකාර කළ යුතු දෙයකි. තමා මෙන
ඇති ලිපිය කෙලින්ම භාරදුනොත්?..

එපා... නිමල් සිත වෙනස් කරගත්තේය. ඔහුට
කෑම පිරියක් නොවීය. ඔහේ කෑමට කෑවා පමණි, උදය සිරි
තව මදකින් වතුර වීදුරුවක් ගෙන ආවේය.

"උදය සිරි -"

"ඔව් සර්."

"කීය වෙනකල් වැඩද?"

"වෙලාවක් නෑ සර් - වහනකල්."

"බ්‍රේක් නැද්ද?"

"බ්‍රේක් තියෙන්නෙ කාර් වලනෙ සර්."

නිමල්ට සිනා නොකර නොහැකි විය.

"වැඩ ඉවර වෙලා ගෙදර යනවද?"

"නෑ සර් - මෙතනමයි ඉන්නෙ"

"මෙතනමයි?"

"ඔව් සර් පිටිපස්සේ කාමරේ අපි තුන් දෙනෙක් නවිල
කරගන්නවා.."

උදයසිරි තවත් බලා සිටියේ තවත් ප්‍රශ්න ඇද්දැයි
කියන්නාක් මෙනි. නිමල් තවත් යමක් නොකීවේය. මේ මිනිහාව
තව දුරටත් අඳුනාගන්නේ කෙසේද යන්නය දැන් ප්‍රශ්නය වූයේ.
උදයසිරි තව මදු මොහොතක් හිස කසමින් සිට මුළුතැන්ගෙයකට
ගියේය.

නිමල් සෙමින් සෙමින් කෑම ගන්නේ විටින් විට උදය සිරි
හා අන් අය ඇසිරෙන ආකාරය නිරීක්ෂණය කරමිනි. නිමල් කෑම කා
අවසර වෙන විටම උදයසිරි යළිත් මේසය වෙතට ආවේය.

"තව මොනවත් ඕනැද සර්? ෆෲට් සැලඩ්? වටලප්පන්?"

"වටලප්පන් එකක් ගේන්න" යි කී විමල් නැගිට පිටුපස සින්ක් එක වෙතට ගොස් අත සෝදා ගත්තේය. ලේන්සුවෙන් අත පිසදා ගන්නාට පසු සිය බිල ගෙවන්නට සල්ලිවලට අමතර විශේෂ සතුටක් කමිස සාක්කුවේ ලාගත්තේය.

උදයසිරි වටලප්පන් කෝප්පය ගෙන ආ විට විමල් සිය අත අර මුදල මිට මෙලෙව්වේය.

"ආං ගන්නවා මේක තමුසෙට -"

උදයසිරි මුදල ගත්තේ වෙව්ලන අතිනි. ඒ අතින්ම එය තම කමිස සාක්කුවේ ලාගත්තේ එදෙස නොබලමිනි. එතැන රුපියල් සියයකම විය.

"සර්!"

"මට තමුසෙත් එක්ක කතා කරන්න ඕනෑ"

"මොනවද සර්?"

"වැඩ ඉවර කීයටද? කඩේ වහන්නෙ කීයටද?"

"දහයට සර්."

"දහයමාරට තමුසෙ පාරට එනවා - හරිද?"

"හරි සර්."

උදයසිරිගේ දෑසේ බියක් සනිටුහන් විය. වටලප්පන් ටික සෙමින් සෙමින් කා දැමූ විමල් පුටුව කල්ලු කරගෙන නැගිට්ටේ යම්කිසි ජයග්‍රහණයක් ලද්දෙකු මෙනි. 'මේ මිනිහා මොකක් හරි දන්නවා ඇති' යි විමල්ට සිතුණේ කඩයෙන් පිටවෙද්දීය.

ගමන් මල්ලත් උරයේ එල්ලාගෙන සිය බස් නැවතුම් ළඟට පැමිණියේය. රාත්‍රී දහයමාර එනතුරු කරන්නට දෙයක් තිබිය යුතුය. කලුතර බෝධිය වන්දනාමාන කර ගන්නට සිතට අදහසක් ආවේය. කොළඹ සිට නිතර එන ගමනේදී බෝධියට පඬුරක් පූජා කර දෑත් මුදුන් තැබුවද ඒ කළේ පුරුද්දක් සේම අන් අය අනුකරණය කරන නිසාවෙනි. දැන් විමල්ට ඕනෑ තරම් කාලවේලා තිබිණි. බෝමළුවේ අයිනක අල්ලාගෙන භාවනා කරන්නට තරම් සිතක් සිය තුළ නොවූවද එතැන තමාගේ සිත එකලාසයක් කරගෙන නිසංසල ගොනු කොට ගත හැකි තැනක් බව ඔහුට පසක් විය. විමල් වෙතද තම පියා වූ උපසේනගේ පුරුද්ද තිබේ.

එනම් කොලයක් ඇනක් ගෙන තම අදහස් ලියා තබන්නට ඔහු ඇරඹීම කළේය. එය තාත්තාගෙන් ලද ආභාසයක් විය හැකිය. බිමල් කුඩා කාලයේදීම, තාත්තා ලියනු බලා, ඊට ලියන්නට පුරුදු වූයේය. ප්‍රථම කාලයේ නම් ඔහු ලිව්වේ අනම් මනම්ය. කෙමෙන් ඔහුගේ අත සිත කඩදාසියට ඇනට හුරු විය. තමා දහ වියේදී ලියූ කවි පෙළක් තාත්තා, කියවා බලා සතුටින් සිනාසුණ හැටි බිමල්ට අදත් මතකය. තාත්තා සිනාසී ඔහුට සුසුමක් ලැබුණි.

බෝධියට මෙපිටින් බසයෙන් බැස්ස බිමල් අසල වූ කඩයකින් අභ්‍යාස පොතකුත් ඇනකුත් මිළදී ගත්තේය. දැන් ඔහුට කාලය ගත කරන්නට විනෝදාංශයක් ලැබිණි. තමාගේ දෛනික හමුවීම්, සිදුවීම් දින පොතක ආකාරයෙන් ලියා තබන්නට ඔහුට සිතුණි. එය දැන් ඔහුට වැදගත් විය. තාත්තා සොයා යන මේ ගමනේ ඇතැම් සිදුවීමක්, තොරතුරක් අත්දැකීමක් සටහන් කරගැනීම මතුවට උපකාරී වේයැයි ඔහුට සිතුණි.

බෝමළුවේ ඇවිද ගිය බිමල් එපිටින් ගලා යන ගඟ දෙස බැලුවේය. "කළු ගංගා රාජිනිය!" බිමල්ට ගීතයක් සිහිවිය. ගඟත් මුහුදත් යාවෙන මේ පරිසරය කෙතරම් සුන්දරද? කොතෙක් සෙනගක් මෙතැන කවදත් කොයි මොහොතේත් වෙයි. මෙතැන පසුකර ගෙන යන හැමදෙනාම මෙතැන නැවතී වන්දනාමාන කරති. පිං කැට වලට මුදල් දමති. හැමට ආශිර්වාද කරන්නට මෙන් මහා වෘක්ෂයෙකි. බෝ පත් සිලි සිලියේ සැලෙයි.

පාරෙන් අනෙක් පස විසල් දාගැබ් රාජයයි. එහි කොත් කැරැල්ල දිවා අහසට නැගී හිරු එළියෙන් බැබලෙයි. පුළුන් වලා රොද කීපයක් සෙවන සදන්නට මෙන් සෙමින් ඇදී යයි. විශාල ධාතු ගර්භය තුළ කොතෙකුට ඇවිද යා හැකිය. බිමල් මෙයට පෙර දෙතුන්වරක් ඒ අභ්‍යන්තරයට ගොස් ඇත..

බිමල් බෝ මළුවෙම කෙළවර තාප්පයට හේත්තු වී ගත්තේය. සෙලවෙන බෝපත් සෙවනේ නිදා සිටියදී ඔහුට අම්මා සිහිවිය. අම්මාට කොහොමද? බිමල් තම ජංගම දුරකථනයෙන් ගෙදරට කතා කළේය.

පිළිතුරු දුන්නේ පද්මා අක්කාය.

"ආං අක්කෙ - අම්මට ප්‍රශ්නයක් නෑ නේද?"

"නෑ නෑ - ඇලවෙලා ඉන්නවා- කාලා, අවර වෙලා

ඇඳට ගියා. කෑම කරන්නද?"

"හාං"

බිමල් එසේ කීවත් පද්මා, සුජාට දුරකථනය දෙනවා වෙනුවට තමන් ප්‍රශ්න අසන්නට වූහය.

"මල්ලි දැන් ඔය කොහේද ඉන්නෙ?"

"කලුතර බෝධිය ළඟ."

"අනේ සාදු! බාරයක් උනාද?"

"එහෙ-මත්-හිතුවා."

"තාත්තා ගැන ආරංචියක් නැද්ද මල්ලි?"

"මං තොරතුරු ටිකක් හොයනවා."

"මොනවා කළත් පරිස්සමෙන් කරන්න මල්ලි"

"හොඳයි හොඳයි- කෝ අම්මට දෙන්න සිංගක්."

පද්මා අක්කා හොඳයි- නිතර හොඳයි. හැබැයි කතා කරන්නට ගත්තාම බදුලු කෝච්චිය වගෙයි. නවත්තලක් නෑ. හැලවේ ඉන්න නිසා ඔනෑ තැනක කැඩිල්ලෙක් වගේ බිල්ලෙක ගතියක් තියෙනවා.

"ඉන්න මල්ලී."

මද මොහොතකට පසු සුජා දුරකථනයට ආවාය.

"අනේ පුතේ කොහේද මේ? තාත්තා ගිය වාගෙ ඔයත් ගියාද?" අම්මා නොනැවතී හැඬුම් හඬින් ප්‍රශ්න කරද්දී බිමල්ට උත්තරයක් දී ගන්නට නම් බලා සිටින්නට සිදු විය. "ඔය කොහේද දැන් ඉන්නෙ?" යැයි ඇසූ අවසාන ප්‍රශ්නයට බිමල් පිළිතුරු දුන්නේය.

"මං හරියටම ඉන්නෙ කලුතර බෝධිය ගාව අම්මෙ- මට තාත්තා ගැන හෝඩුවාවක් ලැබුනා."

"මොකද්ද?"

"තාම හරියටම කියන්න බෑ. අද රෑට දැන ගන්නවා."

"මොකද්ද? මොකද්ද?" සුජාගේ ප්‍රශ්නය ඉක්කාවක් මෙන් කණ්ඨනාලයෙන් නැගී ආවේය.

"මං ගෙට කියන්නං."

"ඒ කියන්නෙ අද ගෙ එන්නෙ නෑ?"

"පුළුවන් උනොත් රෑම එනවා. අම්මා බය නැතුව ඉන්න කෝ."

"බය නැතුව ඉන්නෙ කොහොමද පුතා? ඔයත් තාත්තගෙ ගියොත්.."

"මං බෝධියට භාරයක් වෙනවා." බිමල්ට කියැවිණි.

සුහා මඳකට නිහඬ වූවාය. සාරය සැනසුම් වචනයකි.
බෝධිය සැනසුම් වචනයකි

"කොහේද ද යන්නෙ?" සුහා ඇසුවාය.

"යන්න තැනක් තියෙනවා." විමල් බොරුවක් ගොතුවේය.
"පාලුවෙන් එක්ක." සුහා තවත් ප්‍රශ්න කරන්නට පෙර ඔහු එක්කළේය.

"පරිස්සමෙන්. තෙරුවන් සරණයි බෝසමිඳුන්ගෙ පිහිටයි."
සුහා එසේ කීවේ වෙන කියන්නට දෙයක් නැතිවාක් මෙනි. කොහොමටත් උපසේනව සොයා ගන්නට හැක්කේ විමල්ට පමණක්ම බැයි ඇයට ඇඟෙන්නට ඇති.

විමල් දුරකථනය සාක්කුවේ ලා ගෙන පන්සල් කාමරයට ගේන්තු වී පරිබරි ගැසී පිදගත්තේය. ඉහල බෝ ගසේ අතු දුනී දෙස බැලුවේය. හවස් අව්ව රන් පැහැයට හරෙන බෝපත් සෙමින් සෙලවෙයි. සැපුර දෙසින් නමා එන සුළං රැලක් සියල්ල සනහා ගෙන ගලා යයි. විමල්ගේ දෙනෙත පියැවී ගෙන ගියේය.
ඔහු ඉදිරියෙන් බෝ මළු වැලි තලාවේ කීප දෙනා ඇත මෑත ඇවිද යන්නට ඇති. කෙනෙක් මඳ වේලාවක් තවත් ඔහු දෙස බලා සිටියේය. විමල්ට එසේ හැඟුණි නිසා ඔහු දෙනෙත යන්තම් විවර කළේය. ඔහු අසල දී සුරතොටිල දෙයක් ඉවතට ඇදී යනු පෙනුණි. තවත් දෙනෙත විවර කරද්දී ඒ තරුණියක බව ඔහුට වැටහුණි. ඇය කවුද? කාගේ කවුද? තමා අසල ඇය නැවතුණේ ඇයිද? ඔහුට සිතුණි.

විමල් යළිත් දෑස් පියාගත්තේය. රාත්‍රී ආහාරයට තව කොතරම් වේලාවක් තියෙනවාද? කාලම මිනින්නටම දවසක් වගෙයි.